


**නිෂාධි.**

"ඔයා ජීවත් වෙන්නෙ සිහින ලෝකයක අනුරාධ.. එක දවසක් හරි පය ගහල බලන්න හැබෑ ලෝකෙට... හැමදේම ඔයා හිතනවා වගේ සුන්දර නැහැ..."

**අනුරාධ**

"මගේ වෘත්තියයි මගේ සැබෑ ජීවිතයයි පටලවා ගන්න එපා නිෂාධි... මම රඟපාන චරිත වලින් මාව මනින්න එපා... මාත් ඔයාලා වගේ හිතන පතන සාමාන්‍ය මනුස්සයෙක්... "

**දිලීප**

"අපි ලෝකය දකින්නෙ නැති වුනාට ලෝකය අපි දකිනවා නිෂා... ඇස් වහගෙන ජීවත්වෙන්න හදන්න එපා... ඔයා දවසක අතර මං වෙයි... මට හැමදාම ඔයා ආරක්ෂා කරන්න බැහැ..."

**සඳලි**

"ආත්මාර්ථයෙන් තොර ආදරය කියන එක විහිලුවක් දිලීප... එහෙම එකක් කොහෙද තියෙන්නෙ...? ඔයා හදන්නෙ ඔයාවම රටට්ටා ගන්න... "

24 වන පිටෙන්

''ඇත්තටම වචන ටික ලියන්න ගියේත් ඒ වගේ සුළු වෙලාවක්. ඒක හරි මිහිරි අත්දැකීමක්. අපි ඒ දවස්වල පදිංචි වෙලා උන්න මීගමුවේ නිළ නිවාසය තිබුණේ මුදූ වෙරළ අද්දර. රෑ කෑමෙන් පස්සේ තාප්පය උඩට නැගලා අඳුරේම ටික වෙලාවක් මූද දිහා බලාගෙන ගතකරන පුරුද්දක් මට තිබුණා. දවසක් එහෙම කෑමෙන් පස්සෙ සරම එහෙම ටිකක් ලිහිලට අඳින ගමන් මිදුල අද්දර තියෙන තාප්පය ලඟට යන කෙටි වෙලාවෙදියි වචන ටික ඔක්කොම ඔලුවට ආවෙ. මම තාප්පෙට නගින්න තියපු පය ආපහු අරන් දුවගෙන ගෙට ඇවිත් වචන ටික ලියා ගත්තා. හරියට දෙයියො දුන්නා වගේ. මම ඇයට මගේ අත්දැකීම් කීවෙමි.

මේ ගීයේ වස්තු බීජය රෝපණය කළේ විශාරද ගුණදාස කපුගේ මහත්මයා. කපුගේ අයියගේ ගෙදර සුහද පිළිසඳරේ යෙදිලා උන්නු එක හැන්දෑවක මේ වගේ සිද්ධියක් ගැන කියලා මට කිව්වා, ''මල්ලියෙ පුලුවන් නම් මෙන්න මේවා ලියපන්'' කියලා. මමත් ගමින් පිට වෙලා රාජකාරියේ යෙදිලා හිටපු කෙනෙක් නිසා මටත් දැනුනා තදින්ම. ගමේ නොගිහින් නොහිටියා ~~වුණත් මටත් මේක අදාලයි නේද කියලා එදා හිතුණා.~~ මෙල්බර්න් වලට වෙලා ඉන්න අද මට හිතෙනවා එදාටත් වඩා අද මම නියම ''මද්දුමයෙක්' වෙලාවත් ද කියලා.'' දීපිකා ප්‍රියදර්ශනීයට ස්තූතිවන්තවෙමින් මම කතිකාව නිමා කළෙමි.

මැද්දේ ගම් ගිය
මද්දුමයෝ අද
බද්දේ ගම් ගැන
නැද්ද වගක්?

යානා නේනා මං වරදින්නා
නුඹැහෙට උළුවහු මදි ද පැලේ?
අත අහවර දාවත් ඇයි මන්දා
නෑවිත් ඇරියේ බැද්දේගම් ඉ

අම්මා අප්පා පෝය ගණින්නා
හඳ පායන්නෑ අපට මලේ ඉ
අපි අසරණ දා ගම ගැන බලලා
බින්නෙ බිදේදෝ මැද්දේගම් ?

කොළඹ ඇස්. ගොඩගේ සහ සහෝදරයන් විසින් දියත් කළ කාව්‍ය සහ ගීත ව්‍යාපෘතියෙන් තෝරා, ප්‍රකාශයට පත් කරන ලද ''සිසිරගේ කුරුටු ගී'' ග්‍රන්ථයේ පස්වන පද රචනාව.

From Page 31

this particular tradition can be. As time progress, Chuyia also experiences the cruel undertakings of a widow's world and in the process is destroyed as a child.



The movie elegantly takes us through the heart-wrenching tale of an innocent girl, denied her childhood, as any Westerner would claim, because of strict traditions that her society upholds. With beautiful scenery, emotional music and colorful yet simple dialogue, this movie is definitely one worth watching for anyone who would want to watch a wonderfully created film. These days, it is rare to see people enjoy a film that is deprived of the Hollywood (or Bollywood!) sheen, especially amongst youth. However, "water" embodies a wonderful film, without all the expensive glamour yet so successfully telling the tale of an adorable, young Indian girl. Water is moving, controversial, provocative and at times distribution to those who have forgotten the ways of age-old customs, however the beauty of Chuyia's tale will have you crying for her experiences of turmoil and laughing at her childlike triumphs. You will fall in love with her rebellious spirit and her friendly innocence. This movie is definitely an eye opener, not to be missed.

**Sirini Dharmapriya**
Year 12, St. Columba's College Victoria

